අ.පො.ස උසස් පෙළ

# පෙරදිග සංගීතය



## වැදි ගී

# වැදි ගී

ශ්‍රී ලංකාවේ වාසය කළ මුල් පදිංචිකරුවන් අතුරින් ස්වකීය අනන්‍යතාව යම් තරමකට හෝ රැක ගනිමින් වෙසෙන මනුෂ්‍ය කොට්ඨාශය වැදි ජනතාවයි.“ වැද්දා” යන පදය සංස්කෘත ව්‍යාධ පදයෙන් බිඳී ආවකි.එහි අරුත වන්නේ සතුන් මරණ දඩයක්කාරයා යනුවෙනි.

- උගතුන් විසින් පවසනුයේ යක්ෂ, නේසඳ, මිලක, සබර වැදි ජන කොටස්වල සම්මිශ්‍රණයකින් වැද්දන් බිහි වන්නට ඇති බවයි.
- ආර්.එල්.බ්‍රෝහියර් පවසන්නේ විජය සහ පිරිස විසින් රටේ දකුණු දිග භාගයට පලවා හරින ලද යක්ෂ ගෝත්‍රිකයන්ගෙන් වැදි ජනයා පැවත එන බවයි.
- ඇතැමුන් සඳහන් කරන්නේ යක්ෂ, දේව,නාග, වැදි වශයෙන් ගෝත්‍රිකයින් සිටි බවත් යක්ෂ හා නාග පිරිස් ගොවිතැනට හුරු වූ අතර වැද්දෝ වනයෙහිම දඩයමින් ජීවත් වූ බවකි.
- මලය රජු විසින් මෙහි දමා ගිය පිරිසගෙන් වැදි පරපුර ආරම්භ වූ බව තවත් මතයකි.
- සිංහල සාහිත්‍යයේ වැද්දන් හැඳින්වීම සඳහා මලදරු (ගිරිවැසි) වනසර (වනචාරි) සැරවි (ඊතල දරන්නා) යන අරුත් දක්වා ඇත.

මුඛ පරම්පරාගතව පැවත එන ගී කවි මන්තර හා ජනකථා වැනි ජනශ්‍රැතීන්ගෙන් සමන්විත වූ වැදි ජනයා ව්‍යවහාර කරන භාෂාව පදනම් කොට ගෙන නිර්මාණය වූ සාහිත්‍යය, වැදි සාහිත්‍යය ලෙස හැඳින්වේ.


Copyright © e-thaksalawa.moe.gov.lk

# පෙරදිග සංගීතය

වැද්දන්ගේ භාෂාවට දියුණු වූ අක්ෂර මාලාවක් නොමැත.

අදහස් හුවමාරුව උදෙසා ඔවුන් විසින් නිපදවා ගන්නා ලද වචන මාලාවක් වැදි බසෙහි ඇත. අතීතයේදී සිංහල හා ඉන්දු ආර්ය භාෂාවෙන් වෙනස් වූ භාෂාවක් භාවිතා කරන්න ඇතැයි විශ්වාස කෙරේ. වැද්දන් ගී ගයන විට සියලුම ශබ්ද ඝෝෂ ස්වරූපයක් ගනී.

ලොව පැරණිම ගීතය වැදි ගීතය බව සී. ද එස්. කුලතිලක මහතා පවසයි. ලංකාවේ වැදි ගී පිළිබඳ විග්‍රහයක් කළ " සෙලිග්මාන් " එම ගීතවල ස්වර පරිමානය පහත පරිදි දක්වා ඇත.

1. ගී තනු 9 ක් ස්වර 2කින් යුක්ත වීම.
2. ගී තනු 3ක් ස්වර 2කින් ඇසුරු කිරීම.
3. ස්වර ස්ථාන 3 ඇසුරු කළ ගීත
4. ස්වර ස්ථාපන 4ක් හා එක් ගීතයක් ස්වර 5ක් ඇසුරු කිරීම.

වැදි ගීත ප්‍රධාන ඝන දෙකකි.

1. මන්ත්‍ර හා යාදිනි ගී
2. දරු නැළවිලි ගී හා විනෝදය තකා ගැයූ ගී

වේ.

මෙම ගීත අලංකාර වලින් තොරවූ අතිශයින්ම සරල තත්ත්වයක පවතී. පල්සැඩ්‍රෝ නම් බටහිර ප්‍රාථමික නාද මාලාවෙහි සමාන බවක් වැදි ගී වලද දක්නට ලැබේ. බොහෝ විට ස්වර 2ක් භාවිතා කරමින් ගායනය කරයි. එය " ඉයුඩ්ඩින්" ගායන ක්‍රමයට ශෛලියට සමානකමක් දක්වයි. ඉයුඩ්ඩින් ගායන ශෛලිය යනු එකවර Scale කිහිපයක ගායනා කිරීමයි.

උදා - ස් - ස්

ග - ග්

ම - ම්

අන්තර්ගතය - එල්.එස්.එස්. තිලකරත්න, උපගුරු, ගිරි/ නක්කවත්ත ම.ම.වි. නක්කවත්ත.

සැකසුම - ජී.ඩී.සී.එන්. ගමගේ මෙය - මො/මල්ලවත්තාවල ජාතික පාසල, වැල්ලවාය

The National e-learning Portal for The General Education

Copyright © e-thaksalawa.moe.gov.lk

# පෙරදිග සංගීතය

සී.ද එස්. කුලතිලක මහතා විසින් පවසනුයේ වර්තමානයේ වැදි ගී 10ක් පමණ භාවිතයේ පවතී. මාත්‍රා 16 විරිත බහුලව භාවිතා කර ඇති අතර ඊට අමතරව මාත්‍රා 12, 14 ද යෙදී ඇත.

වැදි ගීත ගැයීමේදී ඒක තනු ක්‍රමය (mono Melodic) අනුගමනය කර තිබේ. වැදි ගී ගයනු ලබන්නේ බොහෝ විට නර්තනයේ යෙදෙමිනි. එමෙන්ම නාද මාලාව ඒකාකාරීය. | රි - රිරි | ස- සස යන ස්වර ඛණ්ඩය සෑම වැදි ගීයකම තනු රටා සඳහාම යොදා ගෙන ඇත. මෙම නාදමාලාව වේගවත්ව ගායනය කළ යුතුය.

උදා - දරු නැලවිලි ගී

" පැට්ටි අඬන්නේ මොන්නට දෝ බොල"

දරුවන් නැලවීමේදී, මංගල අවස්ථාවන්හිදි, දඩයමේ යන අවස්ථාවන්හිදි වැදි ගීත ගායනය කරන ලදී.

නූතන සරල ගී සඳහාද වැදි ගීයෙහි නාද මාලාව භාවිතා කොට ඇත. එසේ නිර්මාණය කරනු ලැබූ ගී පහත දක්වා ඇත.

- ❖ නංගිට බැඳපු මල් වියනයි
- ❖ කොටා දමඤ්ඤං මර මර කොටාදමඤ්ඤා
- ❖ රාහි ඕ මංගලියා
- ❖ මල්වියනෙන් බැදි මහ බැද්දේ උන්
- ❖ මාමිනි මාමිනි මා දෙයියා
- ❖ මල් නැනි මං කැකුලි මං



Copyright © e-thaksalawa.moe.gov.lk